# මහවැලි සංවර්ධන හා පරිසර අමාත්‍යාංශය
மகாவலி அபிவிருத்தி மற்றும் சுற்றாடல் அமைச்சு
Ministry of Mahaweli Development and Environment

"සම්පත්පාය", අංක 82, රජමල්වත්ත පාර, බත්තරමුල්ල, ශ්‍රී ලංකාව.
"சம்பத்பாய", இல 82, இராஜமல்வத்த வீதி, பத்தரமுல்ல, இலங்கை.
"Sampathpaya", No 82, Rajamalwatta Road, Battaramulla, Sri Lanka.
Gen.Tel. + 94-11-2882112 - 3

ලේකම් / செயலாளர் / Secretary +94-11-2877290
ෆැක්ස් / தொலை நகல் / Fax +94-11-2877292


මගේ අංකය / எனது இல / My No — 03/02/02 Tree planting month

ඔබේ අංකය / உமது இல / Your No —

දිනය / திகதி / Date — 2016/08/ 30

පරිසර චක්‍රලේඛ අංක 01/2016

සියළුම අමාත්‍යාංශ ලේකම්වරුන්,
පළාත් සභා ප්‍රධාන ලේකම්වරුන්,
දිසාපති / දිස්ත්‍රික් ලේකම්වරුන්
දෙපාර්තමේන්තු ප්‍රධානීන්,
ප්‍රාදේශිය ලේකම්වරුන්,
ව්‍යවස්ථාපිත මණ්ඩල / රාජ්‍ය සමාගම් ප්‍රධානීන්,

## "වන රෝපා" වැඩසටහන - 2016

### 01 අරමුණ

1.1 පරිසර විෂය භාර අමාත්‍යවරයා ලෙස අතිගරු ජනාධිපතිතුමන් විසින් ඉදිරි වර්ෂ තුනක (03) කාලය තුල රටේ වන ආවරණය 32% ක් දක්වා වැඩි කර ගැනීමෙ ඉලක්කය සපුරා ගැනිම පිණිස, රාජ්‍ය, රාජ්‍ය නොවන හා පෞද්ගලික පාර්ශවකරුවන්ගේ සක්‍රිය දායකත්වයෙන් ක්‍රියාත්මක කරනු ලබන වාර්ෂික වැඩසටහනක් ලෙස "වන රෝපා" ජාතික රුක් රෝපණ වැඩසටහන හඳුන්වාදී ඇත. මෙ යටතේ රුක් රෝපණය විධිමත් පරිදි හඳුන්වා දීම පිණිස සෑම වර්ෂයකම ඔක්තෝබර් මාසය "වන රෝපා" ජාතික රුක් රෝපණ මාසය ලෙස නම් කර ඇත. ඒ අනුව එම වැඩ සටහන රාජ්‍ය අංශයේ, පෞද්ගලික අංශයේ සහ රාජ්‍ය නොවන සංවිධාන වල සහභාගීත්වයෙන් මෙම වසරේ ඔක්තෝබර් 01 වන දින සිට 31 දක්වා පැවැත්විමට සියළු කටයුතු සුදානම් කොට ඇත.

1.2 මෙවර 2016 "වනරෝපා" ජාතික රුක් රෝපණ වැඩසටහනේ ප්‍රධාන උත්සවය අතිගරු ජනාධිපති තුමාගේ ප්‍රධානත්වයෙන් 2016 ඔක්තෝබර් 26 වැනිදා පෙ.ව. 9.00 ට ත්‍රිකුණාමලය දිස්ත්‍රික්කයේදී පැවැත්වේ.

1.3 තවද "වන රෝපා" ජාතික රුක් රෝපණ වැඩ සටහන මගින් ඉටු කර ගැනීමට අපේක්ෂිත අරමුණු ලෙස සුවිශේෂි පාරිසරික පද්ධති සුරැකිම පිණිස ඒ ආශ්‍රිත වන වගා ප්‍රවර්ධනය, ආරක්ෂාව හා නඩත්තුව, ජනාවාස ආශ්‍රිතව තුරු වියන් සැකසීමට දායක වන ගස් වැවීමෙන් හරිත බව ප්‍රවර්ධනය හා එහි ප්‍රතිලාභ ජනතාවට ලැබෙන බව තහවුරු කිරීම, හායනයට ලක් වූ භූමි ප්‍රදේශ සුවිශේෂ රුක් රෝපණ ක්‍රමවේද තුළින් ප්‍රතිස්ථාපනය, රාජ්‍ය, රාජ්‍ය නොවන සංවිධාන සහ පෞද්ගලික අංශ ඒකාබද්ධව සමාජයේ විවිධ ස්ථර නිර්මාණශිලිව හා තිරසර භාවයෙන් යුතු වන රෝපණයන් වෙත යොමු කිරිම ආදීය ප්‍රධාන වශයෙන් දැක්විය හැකිය.

1.4 එමෙන්ම වන විද්‍යාත්මක ක්‍රමවේද අනුගමනය කරමින් අලුතින් වන බිම් ප්‍රමාණය වැඩි කිරීම හා මේවන විට පවතින වන වැස්මේ ගුණාත්මක භාවය වැඩි කිරීම ප්‍රමුඛ කර ගනිමින් කටයුතු කිරීමට ද අපේක්ෂා කෙරේ. මෙම වැඩ සටහන යටතේ හඳුනාගත් නිශ්චිත භූමි ප්‍රදේශ වල එනම් කඳු මුදුන්, ඉහළ ජලාධාර පෝෂක ප්‍රදේශ, ඛාදනයට ලක් වූ වෙනත් භූමි සහ වෙරළ තීර ආශ්‍රිතව හරිත ප්‍රදේශ බහුල වන සේ රුක් රෝපණ කටයුතු සිදු කිරීමට යෝජිතය

1.5 මීට පෙර වර්ෂ වල පැවති ජාතික රුක් රෝපණ වැඩ සටහන් වල දී ලද අත්දැකීම් මත පදනම්ව නව වැඩසටහනෙහි අඩුපාඩු අවම කර ගනිමින් හඳුනාගත් නිශ්චිත ස්ථාන වල සැලසුම් සහගතව හා රුක් රෝපණ වැඩ සටහන්හි තිරසාර බව තහවුරු වන පරිදි මෙම වසරේ ජාතික රුක් රෝපණ මාසය තුළ වැඩ සටහන් ක්‍රියාත්මක කිරීමට අපේක්ෂා කෙරේ.

## 02 උපාය මාර්ග

2.1 මෙම වැඩසටහනේ මුඛ්‍ය පරමාර්ථය වන්නේ මෙරට වන ආවරණය ප්‍රමාණාත්මකව හා ගුණාත්මකව ඉහළ නැංවීම වන අතර ඒ හා සම්බන්ධ බහුවිධ ප්‍රවේශයන් මගින් ජනතාව තුළ රුක් රෝපණය පිළිබඳ ධනාත්මක ආකල්ප ජනිත කරවීමත් අපේක්ෂා කරයි. තමන් විසින් ම නිෂ්පාදනය කරණ ලද පැළ වන රෝපා වැඩසටහන යටතේ රෝපණය කිරීමට පෙළඹීම වඩාත් අගය කරන අතර ඒ සඳහා තම ප්‍රදේශයට, දේශගුණික කලාපයට මෙන්ම තමන්ගේ හෝ තම අවට වෙසෙන ජනතාවගේ ද අවශ්‍යතාවයන්ට ගැලපෙන පැළ සහිත පැළ තවාන් ඇති කිරීම සුදුසු බව මෙයින් යෝජනා කෙරේ.

2.2 රුක් රෝපණ කටයුතු සඳහා ජනතාව ස්වේච්ඡාවෙන්ම යොමුවීමට මෙම වැඩසටහන පිටුවහලක් කරගන්නා ලෙස ඉල්ලන අතර තමන්ගේ හෝ තම පවුලේ සාමාජිකයන්ගේ ජීවිතය හා සම්බන්ධ සුවිශේෂිය දිනයන් සැමරීම, ජාතික වශයෙන් වැදගත් දින සැමරීමට රුක් රෝපණය කිරීමට යොමුවිය හැකි බව ද අවධාරනය කරමි. තවද, ඔබ විසින් නිපදවන වටිනාකමක් සහිත පැළ හිත මිතුරන් සමග හුවමාරු කිරීම, ත්‍යාග ලෙස ලබාදීම ආදිය මගින් මෙම වැඩසටහන අර්ථවත් කළ හැකිය.

2.3 රාජ්‍ය අයතන තුළ "පරිසර කව" පිහිටුවා එමගින් ප්‍රදේශයට සුදුසු පැළ තවාන් සකස් කිරීමට පියවර ගන්නා ලෙස ද සේවකයන් රාජකාරියෙන් බැහැරව ගතකරන කාලයන්හි පැළ තවාන් ඇති කිරීමේ කටයුතුවල නියැලීමට පෙළඹවීම මගින් ඔවුන්ගේ සේවා තෘප්තිය ඉහළ නැංවීමට ද හැකි වේ.

2.4 ත්‍රිවිධ හමුදාවේ සහ සිවිල් ආරක්ෂක බලකායේ සක්‍රිය දායකත්වය රුක් රෝපණ වැඩසටහන් දියත්කිරිම සඳහා ලබාගැනීම මගින් වඩාත් කාර්යක්ෂමව, ඵලදායිව හා තිරසාරව එම වැඩසටහන් පැවැත්වීමට හැකියාව ඇතිවේ. එසේම, අදාළ කඳවුරු භූමිවල සහ ත්‍රිවිධ හමුදාවේ සහ සිවිල් ආරක්ෂක බලකාය යටතේ පවතින වන වගාවට සුදුසු භූමිවල ද, මෙයට ඉහතදි යම් කාර්යයන් සඳහා යොදාගෙන දැනට ඛාදනය වූ තත්ත්වයේ පවතින භූමි තුළ ද තම ප්‍රදේශයට, දේශගුණික කලාපයට සුදුසු පැළ රෝපණය කිරීමට කටයුතු කිරීම සුදුසුය.

2.5 වන රෝපා වැඩසටහන මගින් තුරු ආවරණය ඉහළ නැංවීම ද අපේක්ෂා කරන අතර, විවිධ තුරු වියන් ස්ථරවලින් සමන්විත වන වගාවක් ගෙවතු මට්ටමේ සිට රුක් රෝපණය කිරීමට පහසුකම් ඇති සෑම ස්ථානයකම ස්ථාපනය කිරීමට පියවර ගැනීමට කටයුතු කිරීම මගින් රුක් රෝපණයෙන් අපේක්ෂිත බහුවිධ ප්‍රයෝජනයන් ජාතියට උරුම කිරීමට ද හැකිවේ.

03 ක්‍රමවේදය

3.1 සියලුම දිස්ත්‍රික් ලේකම්වරු විසින් තම දිස්ත්‍රික්කයේ ප්‍රාදේශිය ලේකම් කොට්ඨාශ මට්ටමින් සුදුසු නිශ්චිත ස්ථාන හඳුනා ගෙන, රුක් රෝපණ වැඩ සටහන් ක්‍රියාත්මක කරන ලෙස ඉල්ලා සිටිමි. පළාත් ප්‍රධාන ලේකම්වරුන් විසින් තම පළාතේ එක් එක් පළාත් පාලන බල ප්‍රදේශ වලද එවැනි හඳුනා ගත් නිශ්චිත ස්ථාන වල රුක් රෝපණ වැඩ සටහන් ක්‍රියාත්මක කිරිමද අපේක්ෂා කරමි. එම වැඩසටහන් පිළිබඳ තොරතුරු මෙම අමාත්‍යාංශය වෙත නොපමාව ලබා දීමට හා ප්‍රදේශයේ ප්‍රජා සංවිධාන වල සහභාගීත්වය හා සමස්ථ පාසල් ශිෂ්‍ය ප්‍රජාවගේ ක්‍රියාකාරී දායකත්වය ලබා ගැනීම ද අතිශයින් වැදගත් බව අවධාරණය කරමි.

3.2 මෙම වැඩසටහන ආරම්භයක් ලෙස ඔක්තෝබර් මාසය තුළ ආරම්භ කලද මෙය අප රටෙහි පවතින වර්ෂා කාලය අනුව දිප ව්‍යාප්තව වසර තුළම විවිධ කාල වල ක්‍රියාත්මක වන වැඩසටහනකි. එබැවින් මෙම වැඩ සටහන එළඹෙන රුක් රෝපණ මාසය තුල ආරම්භ කර අඛණ්ඩව වසර පුරා ක්‍රියාත්මක කරන ලෙස ද ඉල්ලා සිටිමි.

3.3 මෙම වැඩසටහන සියලුම රාජ්‍ය ආයතන සම්බන්ධ කරගෙන ජාතික, පළාත් හා ප්‍රාදේශිය මට්ටමෙන් ක්‍රියාත්මක කිරිමට කටයුතු කල යුතු අතර එවැනි සෑම මට්ටමකින්ම ක්‍රියාත්මක කරන වැඩසටහන සඳහා අවශ්‍ය පැළ වන සංරක්ෂණ දෙපාර්තමේන්තුවෙන් සහ රාජ්‍ය දැව සංස්ථාව මගින් ලබාගැනීමේ හැකියාව ඇත. ( වන සංරක්ෂණ දෙපාර්තමේන්තුව හා රාජ්‍ය දැව සංස්ථාව මගින් ලබාගත හැකි පැළ පිළිබඳ තොරතුරු මේ සමග අමුණා ඇත). අදාළ කරුණු පිළිබඳව වැඩිමනත් තොරතුරු දිස්ත්‍රික් පරිසර කමිටු රැස්වීම්වලදී සාකච්ඡා කරන ලෙසද ඉල්ලමි. විශේෂයෙන්ම වන රෝපා වැඩසටහන සඳහා දිස්ත්‍රික් මට්ටමේදී අනෙකුත් රාජ්‍ය ආයතන සමග කටයුතු කිරීමේදී දිසා ලේකම්වරුන්ට සහය විම සඳහා එම කමිටුවේ ලේකම් වශයෙන් දිසා වන නිලධාරීන් කටයුතු කරණු ඇත.

3.4 ඊට අමතරව ඉහත වැඩ සටහනට සමගාමීව පරිසර සංරක්ෂණය පිළිබද දැනුවත් කිරිමේ වැඩමුළු, පළාත්, දිස්ත්‍රික්, ප්‍රාදේශිය හා ග්‍රාමීය මට්ටමෙන් ඔබගේ ආයතනය විසින් 2016 වසරේ ඔක්තෝබර් මස 01 වන දින සිට 31 දක්වා වූ මාසයක කාල සීමාව තුළදී ක්‍රියාත්මක කිරීමට අවශ්‍ය උපදෙස් නිකුත් කරන මෙන් කාරුණිකව ඉල්ලමි.

3.5 මෙම රුක් රෝපණ වැඩ සටහන යටතේ සිටුවන සෑම පැළයක්ම රැක බලා ගැනීම, නඩත්තු කිරිම හා වාර්තා පවත්වා ගැනීම අතිශයින් වැදගත් වන අතර ඒ අනුව මෙම කාර්යයට සම්බන්ධ වන ආයතන විසින් මේ සඳහා පසුවිපරම් ක්‍රියාවලියක් සිදු කිරිම උචිත යැයි ද යෝජනා කරමි.

04 සම්බන්ධීකරණය

4.1 "වන රෝපා" ජාතික රුක් රෝපණ වැඩ සටහන ජාතික මට්ටමෙන් සම්බන්ධීකරණය කිරිම සඳහා මෙම අමාත්‍යාංශය යටතේ අධ්‍යක්ෂ (වන සම්පත්) යටතේ වන රෝපා කාර්යාංශය නමින් වෙනම ඒකකයක් ස්ථාපිත කර ඇති අතර එහි දුරකථන අංක හා ෆැක්ස් අංක පහත දැක්වේ.

දුරකථන අංක - 011 -2878806 / 011 – 2866656
ෆැක්ස් අංක - 011 - 2877287
විද්‍යුත් තැපැල - dirfr@environmentmin.gov..lk / wanaropatpp@gmail.com

4.2 මීට අමතරව මෙම වැඩ සටහන ක්‍රියාත්මක කිරීමේ දී අවශ්‍ය කරන සහාය හා උපදේශන සේවා අමාත්‍යාංශයේ විවිධ අංශ වලින් හා ආයතන වලින් සැපයෙනු ඇත.

උදය ආර්. සෙණෙවිරත්න
ලේකම්
මහවැලි සංවර්ධන හා පරිසර අමාත්‍යාංශය

**පිටපත්:**

1. ජනාධිපති ලේකම් - දැන ගැනීම පිණිස
2. අග්‍රාමාත්‍ය ලේකම් - දැන ගැනීම පිණිස
3. විගණකාධිපති - දැන ගැනීම පිණිස
4. වන සංරක්ෂක ජනරාල්, වන සංරක්ෂණ දෙපාර්තමේන්තුව
5. අධ්‍යක්ෂ ජනරාල්, වෙරළ සංරක්ෂණ හා වෙරළ සම්පත් කළමනාකරණ දෙපාර්තමේන්තුව
6. සභාපති, මධ්‍යම ඉංජිනේරු උපදේශන කාර්යාංශය
7. සභාපති, මධ්‍යම පරිසර අධිකාරිය
8. අධ්‍යක්ෂ ජනරාල්, ශ්‍රී ලංකා මහවැලි අධිකාරිය
9. සභාපති, රාජ්‍ය දැව සංස්ථාව
10. සභාපති, භූ විද්‍යා හා පතල් කාර්යාංශය
11. සභාපති, ජාතික මැණික් හා ස්වර්ණාභරණ අධිකාරිය
12. සභාපති, සමුද්‍රීය පරිසර ආරක්ෂණ අධිකාරිය
13. සභාපති, මැණික් හා ස්වර්ණාභරණ පර්යේෂණ හා අභ්‍යාස ආයතනය

(4 – 13) අවශ්‍ය සහාය ලබා දීම සඳහා

"වන රෝපා" ජාතික රුක් රෝපණ වැඩසටහන - 2016

දෙපාර්තමේන්තුවට අයත් පැල තවාන් පිළිබඳ තොරතුරු ලබාගැනීම

| දිස්ත්‍රික්කය | පැල තවාන (රාජ්‍ය) | පැල වර්ග | පැල ප්‍රමාණය |
|---|---|---|---|
| අනුරාධපුර | (ව.සං.දෙ.)කෝපාකුලම හා කළාඔය පැල | තේක්ක, කොස්, හල්මිල්ල, කුඹුක් කොහොඹ, | 7,000 |
| පොලොන්නරුව | (ව.සං.දෙ.)ඊරිගෙඔය පැල තවාන | තේක්ක, කුඹුක්, කොහොඹ,මී, හල්මිල්ල | 7,000 |
| අම්පාර | (ව.සං.දෙ.)පරගහකැලේ පැල තවාන | තේක්ක, කායා, කුඹුක්, මාදං, මී, පළු | 7,000 |
| මඩකලපුව | (ව.සං.දෙ.)දි.ව.නි කාර්යාලීය පැල තවාන | තේක්ක, හල්මිල්ල,කොස්, බුරුත, කායා, පාරමාර | 7,000 |
| ත්‍රිකුණාමලය | (ව.සං.දෙ.)දි.ව.නි කාර්යාලීය පැල තවාන | තේක්ක, කොස්, කුඹුක්, මී, කායා | 8,000 |
| වව්නියාව | (ව.සං.දෙ.)පම්පෙමඩුව පැල තවාන | තේක්ක, හල්මිල්ල,කොස්, බුරුත, කායා | 7,000 |
| යාපනය | (ව.සං.දෙ.)දි.ව.නි කාර්යාලීය පැල තවාන | කොස්,කුඹුක්, පිහිඹියා, හල්මිල්ල | 6,000 |
| කිලිනොච්චිය | (ව.සං.දෙ.)පොන්නගර් පැල තවාන | හල්මිල්ල, කොහොඹ, ඇහැළ | 6,000 |
| මුලතිව් | (ව.සං.දෙ.)වසන්තපුරම් පැල තවාන | හල්මිල්ල, කොහොඹ, ඇහැළ | 9,000 |
| මන්නාරම | (ව.සං.දෙ.)අඩවි වන කාර්යාලය පැල තවාන | හල්මිල්ල, කොහොඹ, ඇහැළ | 6,000 |
| කුරුණෑගල | (ව.සං.දෙ.)අඩවි වන කාර්යාලය පැල තවාන,මැදගම හා වැව රවුම පැල තවාන | තේක්ක, මහෝගනී, කොස්, ඇහැළ, කුඹුක්, නැදුන්, පිහිඹියා, හල්මිල්ල | 9,000 |
| කළුතර | (ව.සං.දෙ.)නාගොඩ, වග, ඉංගිරිය, අගලවත්ත, දෙපානම පැල තවාන | මහෝගනී, තේක්ක, කුඹුක්, නැදුන්, හොර | 18,000 |
| පුත්තලම | (ව.සං.දෙ.)ඉගිණිමිටිය හා කලාඔය තවාන් | තේක්ක, කොස්, හල්මිල්ල, පිහිඹියා ඇහැළ, මී, කායා | 14,000 |
| ගම්පහ | (ව.සං.දෙ.)හොරකැලේ පැල තවාන -මීරිගම | මහෝගනී, තේක්ක, පිහිඹියා, කුඹුක්, නා, කොහොඹ | 14,000 |
| මහනුවර | (ව.සං.දෙ.)පොල්ගොල්ල පැල තවාන් | මහෝගනී ,තේක්ක, කොස්, කුඹුක්, ගිනිසපු, මී, පිහිඹියා | 6,000 |
| මොණරාගල | (ව.සං.දෙ.)හඳපානාගල පැල තවාන | තේක්ක, මහෝගනී, කුඹුක්, මී,කොස්, කොහොඹ, සියඹලා, හල්මිල්ල, ඇහැළ | 8,000 |
| නුවරඑළිය | (ව.සං.දෙ.)රම්බොඩ පැල තවාන | කුඹුක්, සපු, නා, කොට්ටම්බා, | 6,000 |
| මාතලේ | (ව.සං.දෙ.)ඉබ්බන්කටුව පැල තවාන | කොස්, මී, නා, ලුණුමිදෙල්ල, සපු, පිහිඹියා, ඇහැළ | 6,000 |
| බදුල්ල | (ව.සං.දෙ.)මීගහකිවුල පැල තවාන | කොස්, මහෝගනී, මී, පිහිඹියා, ගිනිසපු, කුඹුක්, ඇහැළ, නා, හල්මිල්ල, බුළු, දඹ | 6,000 |
| කෑගල්ල | (ව.සං.දෙ.)නාරම්බැද්ද පැල තවාන | මහෝගනී, කොස්,පිහිඹියා,මී, නා, කොහොඹ | 10,000 |
| මාතර | (ව.සං.දෙ.) නාඳුගල, විල්පිට, අකුරැස්ස අ.ව.නි. කාර්යාලීය පැල තවාන් | මහෝගනී, කොස් හොර, පිහිඹියා, නැඳුන්, බුරුත | 6,000 |
| රත්නපුර | (ව.සං.දෙ.)මුවගන්කන්ද, තිඹොල්කැටිය පැල තවාන් | තේක්ක, කොස්, මී, හල්මිල්ල, මාදං, වැබුබියා | 14,000 |
| ගාල්ල | (ව.සං.දෙ.)කොට්ටව, කන්නෙලිය පැල තවාන් | මහෝගනී, පිහිඹියා, නැඳුන්, මී, ඇටඹ, ඇහැළ; කුඹුක්, හොර, නා, ගිනිසපු | 6,000 |
| හම්බන්තොට | (ව.සං.දෙ.)රිදියගම පැල තවාන | තේක්ක, කොස්, කොහොඹ, බුරුත, ඇහැළ, පිහිඹියා, පළු, වීර, කුඹුක්, මී, හල්මිල්ල, කායා | 7,000 |
| එකතුව | | | 200,000 |

[illegible]

<u>පැල තවාන් වල නිකුත් කළ හැකි තත්ත්වයේ ඇති පැල වර්ග හා ප්‍රමාණයන්</u>

| | ප්‍රාදේශිකය | තවාන ස්ථාපනය කළයුතු ස්ථානය | පැල වර්ග | | වර්තමාන තත්ත්වය | ප්‍රමාණය |
|---|---|---|---|---|---|---|
| 1 | පොලොන්නරුව<br>දු.අ.0772862780<br>ප්‍රාදේශිය කළමනාකර<br>ඒ.එන්.ඩබ්.ඒ.ආනන්ද<br>මහතා | පොලොන්නරුව | මිල්ල | 1238 | පැල සිටුවිම සඳහා නිකුත් කළ හැකි තත්ත්වයේ ඇත. | 9369 |
| | | | හල්මිල්ල | 680 | | |
| | | | කලුවර | 65 | | |
| | | | වැලි අනෝද | 50 | | |
| | | | තිඹිරි | 670 | | |
| | | | බුලු | 165 | | |
| | | | කුඹුක් | 1882 | | |
| | | | තේක්ක | 1587 | | |
| | | | කෝන් | 40 | | |
| | | | රුක් අත්තන | 32 | | |
| | | | මාදං | 175 | | |
| | | | ඇහැල | 521 | | |
| | | | පිහිඹිය | 805 | | |
| | | | කොලොන් | 368 | | |
| | | | අඹ | 30 | | |
| | | | දෙහි | 260 | | |
| | | | පලු | 120 | | |
| | | | කුඩු දවුල | 12 | | |
| | | | වීර | 17 | | |
| | | | කොහොඹ | 88 | | |
| | | | මදටිය | 06 | | |
| | | | කුරුඳු | 30 | | |
| | | | කැටකැල | 08 | | |
| | | | පාරමාර | 15 | | |
| | | | කොස් | 110 | | |
| | | | හුලංහික් | 22 | | |
| | | | සියඹලා | 50 | | |
| | | | බුරුත | 13 | | |
| | | | තෙලඹු | 220 | | |
| | | | ඇට තිඹිරි | 90 | | |
| 2 | අනුරාධපුරය<br>දු.අ.0252222380<br>ප්‍රාදේශිය කාර්යාලය | මැදවච්චිය | කළුවර | 2500 | පැල සිටුවිම සඳහා නිකුත් කළ හැකි තත්ත්වයේ ඇත | 7000 |
| | | | කුඹුක් | 1000 | | |
| | | | මී | 1000 | | |
| | | | පිහිඹිය | 500 | | |
| | | | කොස් | 500 | | |
| | | | ඇහැල | 500 | | |
| | | තලාව | කළුවර | 500 | | |
| | | | මී | 300 | | |
| | | | කොස් | 200 | | |

| | | | | | |
|---|---|---|---|---|---|
| 3 | මහනුවර<br>0812421717<br>ප්‍රාදේශීය කාර්යාලය | මාතලේ ගබඩාව<br><br>නෙලුන්දෙනිය ගබඩාව | මී 566<br>අඟල් 09 උසය<br>තේක්ක 50<br>අඟල් 09 උසය<br><br>මහෝගනී 1000<br>උස අඩි 08<br><br>මහෝගනී 1804<br>උස අඩි 08 | පැල සිටුවීම සඳහා නිකුත් කළ හැකි තත්ත්වයේ ඇත | 3420 |
| 4 | කුරුණෑගල<br>දු.අ.0715886664<br>නිහාල් රත්නායක මහතා<br>සහකාර ප්‍රා.කළමණාකාර | නිකවැරටිය<br><br>කුලියාපිටිය | ඇහැල 100<br>නා 100<br>මහෝගනී 900<br>කුඹුක් 100 | පැල සිටුවීම සඳහා නිකුත් කළ හැකි තත්ත්වයේ ඇත | 1200 |
| 5 | මාතර<br>දු.අ.0912245733 | උණවටුන | කුඹුක් 650<br>නා 250<br>නැදුන් 150<br>මී 400<br>තේක්ක 140<br>කළුවර 300<br>මුණමල් 35<br>පිහිඹිය 200<br>දොඹ 650<br>මහෝගනී 2300 | පැල සිටුවීම සඳහා නිකුත් කළ හැකි තත්ත්වයේ ඇත | 5075 |
| 6 | මොණරාගල<br>දු.අ.0552276334<br>ප්‍රාදේශීය කාර්යාලය | කුඹුක්කන ගබඩාව<br><br><br><br><br><br><br>වැල්ලවාය ගබඩාව | කුඹුක් 4210<br>කළුවර 905<br>මී 71<br>කොස් 710<br>ඇහැල 14<br>සියඹලා 50<br><br>කුඹුක් 1900<br>ඇත්දෙමට 40<br>මී 200<br>කලුවර 180<br>ඇටතිඹිරි 30<br>පිහිඹිය 960<br>කොස් 200<br>කෝපි 100<br>මහෝගනී 70<br>තෙලඹු 55<br>තේක්ක 150<br>දඹ 75 | අඩි 01 ක් පමණ උසය.<br><br>කළුවර පැල පමණක් අඟල 05 ක් පමණ උසය. | 5960<br><br><br><br><br><br><br>3960 |
| 7 | අම්පාර<br>දු.අ.0632224659 | සප්‍රාක කාර්යාලය | තෙළඹු 600<br>කුඹුක් 900 | පැල සිටුවිය හැකි තත්ත්වයේ ඇත. | 1500 |
| 8 | යාපනය<br>0772862733<br>ප්‍රාදේශීය කළමණාකාර ස්කන්ධරාසා මහතා | නල්ලූර් ගබඩාව | මහෝගනී 2000<br>කොස් 1500 | පැල සිටුවිය හැකි තත්ත්වයේ ඇත. | 3500 |

| | | | | | |
|---|---|---|---|---|---|
| 9 | රත්නපුරය<br>දු.අ.0777873734<br>ප්‍රාදේශිය කළමනාකාර<br>රාජපක්ෂ මහතා | තිඹොල්කැටිය<br>මිදලන | නා 200<br>මහෝගනි 800<br>කුඹුක් 520<br>කොස් 250<br>ඇලස්ටෝනියා 200<br>මාර 100<br>හොර 260<br>මී 40<br>දූරියන් 250 | පැල සිටුවිය හැකි තත්ත්වයේ ඇත. | 2620 |
| 10 | බණ්ඩාරවෙල<br>දු.අ.0772642374<br>අජිත් නන්දන මහතා<br>ප්‍රාදේශිය කළමණාකාර | මිරිස්වත්ත | තේක්ක 1800<br>මී 800<br>පිහිඹිය 400<br>මහෝගනි 1000<br>හුලංහික් 60<br>ඇටඹ 40<br>මාදං 200<br>කුඹුක් 1000<br>නා 30<br>රඹුටන් 10<br>යකහලුදුන් 08 | සියලු පැල අඩි 01 සහ අඩි 1,1/2 ක් උසය. | 5348 |
| 11 | නුවරඑළිය | කිතුල්ගල<br>දු.අ.0362287521.<br>වීරසිංහ මහතා | වුනා 1500<br>මී 300<br>කොට්ටම්බා 200<br>පිහිඹිය 600 | පැල අගල් 06 සහ අගල් 07 ක් උසය. පැල සිටුවීම සඳහා සුදුසුය. | 2600 |
| 12 | කොළඹ | කල්දෙමුල්ල නව ගබඩාව<br>මීරිගම ගබඩාව<br>දු.අ.0713759064<br>නියෝජ්‍ය ප්‍රාදේශිය කළමණාකාර<br>අල්විස් මහතා | කුඹුක්/මී 250 අඩියක් උසයි.<br><br>මහෝගනි 500 අඩියක් උසයි | පැල නිකුත් කිරීමට සුදුසුය. | 750 |
| 13 | කල්දෙමුල්ල | කල්දෙමුල්ල සංකීර්ණය<br>දු.අ. 0778673475<br>වයි.ඒ.එල්.රම්‍යකුමාර මහතා<br>කළමණාකරණ සහකාර | කුඹුක් 300<br>මී 500<br>අලිපේර 10<br>දූරියන් 25<br>රඹුටන් 25<br>නා 25<br>දොඹ 10 | සිටුවීම සඳහා පැල ලබාදිය හැකි තත්ත්වයේ ඇත. | 895 |

<u>සිටුවීමට නිකුත් කළ හැකි පැල සංඛ්‍යාව - 50197</u>